සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**අවසාන වාර පරීක්ෂණය 2015**

**9 ශ්‍රේණිය** # නර්තනය **කාලය පැය 2.30 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 උඩරට නර්තන සම්ප්‍රදායේ වන්නම් රචනා වුවා යැයි සැලකෙන්නේ,
(1) පොළොන්නරු යුගයේදී (2) මහනුවර යුගයේදී
(3) දඹදෙණි යුගයේදී (4) කෝට්ටේ යුගයේදී

02 කරදිය මුද්‍රා නාටකය නිර්මාණය කළේ,
(1) වසන්ත කුමාර මහතා (2) පණීභාරත මහතා
(3) චිත්‍රසේන මහතා (4) ප්‍රේමකුමාර එපිටවෙල මහතා

03 සණ වාද්‍ය භාණ්ඩ අතැතිව නටනු ලබන්නේ,
(1) උඩැක්කි පන්තේරු (2) තාලම් සවරං
(3) තාලම් පන්තේරු (4) සවරං කඩු

04 ''තා තෙයියත් තා තෙයියත් තා තෙයියත් තා තෙයි'' මෙය,
(1) පස්වන පා සරඹය (2) හයවන පා සරඹය
(3) හතරවන පා සරඹය (4) අටවන පා සරඹය

05 නර්තනයේ දී කාලයේ වේගය ලෙස හඳුන්වන්නේ,
(1) ලය (2) ග්‍රහ (3) තිත (4) තාලය

06 ගොඩ සරඹ පුරුදු වීමේදී වැදගත් වන්නේ,
(1) පාදාංග සහ වාදනය (2) පාදාංග සහ හඬ
(3) පාදාංග සහ අත් (4) පාදාංග සහ ගායනය

07 ''තකට දොදොංතා දොංගඩ' මෙය,
(1) තුරඟා වන්නමේ සීරුමාරුව (2) සැවුලා වන්නමේ සීරුමාරුව
(3) ගජගා වන්නමේ සීරුමාරුව (4) වෛරොඩි වන්නමේ සීරුමාරුව

08 උඩරට නර්තනයන් බහුලව දක්නට ලැබෙන්නේ,
(1) කතරගම පෙරහැරේ දී (2) සමන් දේවාල පෙරහැරේ දී
(3) මහනුවර දළදා පෙරහැරේ දී (4) දෙවුන්දර පෙරහැරේ දී

09 ශාස්ත්‍රීය නැටුම් හැම විටම,
(1) සරලය.
(2) ලාලිත්‍යය සහිතය.
(3) සංකීර්ණය.
(4) වෙනස් නොවන සම්මත නීති රීති වලින් බැඳී පවතී.

10 නර්තන ශෛලීන් දෙකක් වෙන් කොට හඳුනා ගත හැක්කේ,
(1) වාද්‍ය භාණ්ඩ, ඇඳුම් පැළඳුම් හා තාලම් පට. (2) වාද්‍ය භාණ්ඩ, ඇඳුම් පැළඳුම් හා චලන.
(3) වාද්‍ය භාණ්ඩ, චලන හා තාලම් පට. (4) වාද්‍ය භාණ්ඩ හා නාද මාලා අනුවය.

11 දණ්ඩියමේ සරඹ නැටීමේ දී පැරණි සිංහල සංස්කෘතික ලක්ෂණ විද්‍යාමාන වන තැනකි,
(1) පා සරඹ අවසානය (2) නමස්කාරය කිරීම (3) දණ්ඩි කඳ ඇල්ලීම (4) මැණ්ඩිය පහත් වීම

12 තිත ගොඩ නැඟී ඇත්තේ,

(1) පද වලින් (2) කණ්ඩිලම් වලින් (3) මාත්‍රා වලින් (4) ආඝාත වලින්

13 දෙතිතේ ප්‍රධාන වශයෙන් කොටස්,

(1) 02 කි. (2) 04 කි. (3) 03 කි. (4) 06 කි.

14 පහත භාණ්ඩ අතරින් ආතත භාණ්ඩයක් නොවන්නේ,

(1) රබාන (2) සොෂිණ බෙරය (3) බුම්මැඩිය (4) දවුල

15 'තතුං ජිං ජිං තකට දොං තක' මෙම බෙර පදය අයත් වන්නේ,

(1) සුළු මැදුම් දෙතිතට (2) සුළු මහ දෙතිතට (3) මැදුම් මහ දෙතිතට (4) මහ තනි තිතට

- **පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

16 සින්දු වන්නම් යනු පහතරට නර්තන සම්ප්‍රදායේ එන වන්නම් ය. ( )

17 දෙවොල් මඩුව සබරගමුවේ ප්‍රධාන ශාන්ති කර්මයයි. ( )

18 රුහුණු බෙරය ලෙසින් දවුල හඳුන්වයි. ( )

19 උඩරට කස්තිරම මෙන් පහතරටදී ඉරට්ටිය නටයි. ( )

20 දේවාභරණ තැම්පත් කරන්නේ 'අයිලය' නම් ස්ථානයේ ය. ( )

(1 x 20 = 20)

- **පහත සඳහන් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**

21 සතර බීජාක්ෂර නම් කරන්න. ..............................................................................................

22 තම්මැට්ටමට කියන තවත් නමක් ලියන්න. ..............................................................................

23 පොළොන්නරු යුගයේ දී නර්තන කලාවට සේවය කළ රජතුමා නම් කරන්න.

..........................................................................................................................................

24 උඩරට වන්නමක කොටස් කීයද? ..........................................................................................

25 තාලම්පටින් නිකුත් වන ධ්වනි මොනවා ද? ..........................................................................

(2 x 5 = 10)

## II කොටස

- **තෝරාගත් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01 මාත්‍රා 03 නේ තාලයට අයත් වන්නමක.

කවි පද 02

කස්තිරම

අඩව්ව ප්‍රස්තාර ගත කරන්න.

02 අනුරාධපුර හා පොළොන්නරු යුගවල නර්තන කලාව පැවති අයුරු කෙටියෙන් පහදන්න.

03 ද්‍රවිඩ ගැමි නැටුම් නම් කර ඒවා පිළිබඳව සරලව පහදන්න.

04 දේශීය නර්තන කලාවට උරදුන් ශ්‍රේෂ්ඨ නර්තන ශිල්පියෙක් වන පණීභාරත මහතාගේ සේවය පිළිබඳව සඟරාවකට ලිපියක් ලියන්න.

05 මහනුවර දළදා පෙරහැරේ සංස්කෘතික වටිනාකම අගයන්න.

06 (1) දේශීය වාද්‍ය භාණ්ඩ අතර ප්‍රදාන සාම්ප්‍රදායික භාණ්ඩ 03 නම් කරන්න.

(2) ඉන් එකක් ඇඳ දක්වන්න.

(ල.50)

e-thaksalawa National e-learning Portal for the General Education